**සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල - 2023**
**------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
### 1.1 තත්ත්වාගණනය කළ මතය

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02 හි 27 (අ) ඡේදය ප්‍රකාරව අරමුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ආරම්භක හා අවසාන මුදල් ශේෂයන් ගැලපීමෙන් මුළු ශුද්ධ මුදල් ප්‍රවාහය රු.48,900,380 ක මුදල් ගලා යාමක් වුවද, ඒ අකාරයට ගැලපීම් නොකර සියලුම ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.98,156,637 ක මුදල් ගලායාමක් වශයෙන් රු.49,256,257 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද, රු.110,782,203 ක් වූ ස්ථාවර වත්කම්වල වාර්ෂික ක්ෂය වටිනාකම රු.111,195,429 ක් වශයෙන් රු.413,226 ක් වැඩියෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වාර්ෂික ලාභයට ගලපා තිබුණි. | හරස් සටහන් හා භාණ්ඩාගාර අරමුදල් මාරු කිරීම ආදී සියළුම අංග ගලපා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකසා ඇති බවත්, ඒවා ඇතුළත් නොකර මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් නොකළහොත් නිවැරදිව ගැළපීම් කිරීමට නොහැකි බව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අරමුදලේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව භාණ්ඩාගාර තැන්පතු ගිණුමේ ශේෂය සහ භාණ්ඩාගාර පොත් අනුව සත්වොද්‍යාන සංවර්ධන සහ සුභසාධන අරමුදලේ තැන්පතු ගිණුමේ ශේෂය අතර වර්ෂ ගණනාවක සිට පැවති රු.32,484,882 ක වෙනස පිළිබඳව සොයා බලා නිවැරදි කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති සමුච්චිත අරමුදලේ ශේෂයෙන් අඩු කර භාණ්ඩාගාර පොත් සමඟ ශේෂයට සමාන කර දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වෙනස නිරවුල් කිරීමට කටයුතු කළ බැවින්, භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු මුදල් පොත් සමානව තුලනය කර ඇත. | මෙම වෙනස පිළිබඳව සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමරු අලෙවිහලේ සමාලෝචිත වර්ෂයේ සමරු අලෙවියෙන් හා ටී-ෂර්ට් අලෙවියෙන් ඉපයූ ආදායම රු.63,520 ක් හා එහි විකුණුම් පිරිවැය රු.1,012,931 ක් වීමෙන් රු.949,411 ක අලාභයක් ලබා තිබුණ ද, ඊට අදාළ ලාභ අලාභ ගිණුමෙහි විකුණුම් රු.52,320 ක් හා විකුණුම් පිරිවැය රු.52,320 ක් වශයෙන් සඳහන් කර ලාභ අලාභ නොමැති තත්ත්වයක් සඳහන් කර තිබීමෙන් අරමුදලේ සමාලෝචිත වර්ෂයේ අලාභය රු.949,411 ක් අඩුවෙන් දැක්වුණි. | 2024 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | අලෙවි ආදායම හා විකුණුම් පිරිවැය නිවැරදිව ගැලපීමට කටයුතු කළ යුතුය. |

## 1.6 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.976,986,019 ක් සහ මුළු වියදම රු.1,164,622,896 ක් වීමෙන් ආදායම ඉක්මවා දැරූ වියදම රු.187,636,877 ක් විය. මේ ආකාරයට දිගින් දිගටම ආදායම ඉක්මවා වියදම් දැරීම නිසා අරමුදලේ ශේෂය හායනය වෙමින් පැවති අතර 2019 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය වන විට අරමුදලේ ශේෂය රු.මිලියන 995.15 කින් හෙවත් සියයට 34 කින් පමණ අඩු වී තිබුණි. | සත්වෝද්‍යානය නැරඹීමට පැමිණෙන නරඹන්නන්ගේ සංඛ්‍යාව ශීඝ්‍රයෙන් පහළ වැටීම නිසා අරමුදලේ ආදායම අවම විය. මේ හේතුවෙන් භාණ්ඩාගාරයේ අරමුදලේ ශේෂයෙන් මුදල් ලබාගත් අතර, මෙම වර්ෂයේ ආරම්භයේ සිට අරමුදලේ ආදායමේ වර්ධනයක් පෙන්නුම් කරන බැවින්, වියදම් කළමනාකරණය කරගත හැක. | ආදායම් වර්ධනය කරගනිමින් හා මනා ලෙස වියදම් කළමනාකරණය කර ගනිමින් ලාභය උපරිම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.7.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජංගම වගකීම් යටතේ වර්ෂ 05 කට අධික කාලයක සිට පැවත එන ණයහිමි ශේෂය රු.340,982 ක් හා ව්‍යවස්ථාපිත තැන්පතු ශේෂය රු.112,592 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එම ශේෂයන් පිළිබඳ තොරතුරු තහවුරු කරගැනීමෙන් පසු 2024 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදි නිවැරදි කිරීමට කටයුතු කරමි. | මෙම ශේෂයන් තහවුරු කරගෙන නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.187,636,878 ක අලාභයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය වූ රු.429,958,380 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.242,321,502 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රවේශ පත්‍රවල මිල ගණන් ඉහළ දැමීමත්, පැමිණෙන නරඹන්නන් සංඛ්‍යාව ඉහළ යාමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේදී රු.මිලියන 66 ක වියදමකින් මිලදී ගන්නා ලද විදේශීය පක්ෂීන් 136 දෙනෙකු ප්‍රදර්ශනය කිරීම සඳහා හම්බන්තොට සෆාරි උද්‍යානයේ ඉදිකරනු ලබන පක්ෂි අරණෙහි ඉදිකිරීම් කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 18.8 ක වියදමක් දරා තිබුණ ද, ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබීම හේතුවෙන් පක්ෂීන් 57 දෙනෙකු ප්‍රදර්ශනය කිරීමකින් තොරව සෆාරි උද්‍යානයේ වෙනත් කූඩුවල රඳවා තිබුණි. | දෙහිවල සත්වෝද්‍යානයෙන් ඉල්ලුම් කරන ලද පක්ෂීන් 72 ක් දෙහිවල සත්වෝද්‍යානයට යවන ලදි. සෆාරි උද්‍යානයේ රඳවා ඇති පක්ෂීන් 57 දෙනා ප්‍රදර්ශනයට යොමු කළ නොහැකි වූයේ එම සතුන් සඳහා ඉදි කරමින් පැවති විදේශීය පක්ෂි අරණ හා සුරතල් සත්ව කලාපයේ පක්ෂි අරණ නිමවා නොතිබීම නිසාය. | විශාල වියදමක් දරමින් පක්ෂීන් මිලදී ගැනීමේ අරමුණ ඉටු වන පරිදි එම පක්ෂීන් ප්‍රදර්ශනය කර ආදායම් ඉපයීමටත් එම පක්ෂීන් ආරක්ෂා කර වර්ධනය කර ගැනීමටත් කටයුතු කළ යුතුයි. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 25.7 ක ප්‍රතිපාදන යටතේ දෙහිවල සත්වෝද්‍යානයේ නිම කිරීමට සැලසුම්කර තිබුණු කාර්යයන් 04 ක් වර්ෂය තුළදී නිම කිරීමට නොහැකි වී තිබුණු අතර, ඉන් අත්‍යවශ්‍ය කාර්යයන් වූ රු. මිලියන 4.2 ක ප්‍රතිපාදන යටතේ දෙපාර්තමේන්තුව වෙත වෙබ් පිටුවක් නිර්මාණය කිරීම හා රු. මිලියන 0.5 ක ප්‍රතිපාදන යටතේ සත්වෝද්‍යානය තුළ CCTV කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීමේ කාර්යයන්හි භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 5 ක් හා සියයට 20 ක් විය. | රු.මිලියන 25.70 ක ප්‍රතිපාදන යටතේ මෙම ව්‍යාපෘති ආරම්භ කළ ද අක්මුදල් නොමැති වීම මත අත්‍යවශ්‍ය CCTV කැමරා කිහිපයක් සවිකිරීම පමණක් සිදු කර ඇත.<br>අක්මුදල් නොමැතිවීම මත විදුලි වැට ඉදිකිරීම ව්‍යාපෘතිය ඉටුකිරීමට නොහැකි විය. | අවශ්‍යතාවයන් හඳුනාගෙන නිසි සැලසුම්ගත වැඩ පිළිවෙලක් ඔස්සේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමටත්, බැහැරවීම්වලදී සැලසුම් සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | හම්බන්තොට සෆාරි උද්‍යානය තුළ පිහිටි කාන්තාර කලාපයේ (Desert Zone) තාප්පයෙහි වැඩ කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 5 ක ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, එම වැඩ | අක්මුදල් නොමැති වීම නිසා ආයතනයේ ආරක්ෂාව වැනි අත්‍යවශ්‍ය ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් ව්‍යාපෘති නිම කරන ලදී. CCTV පද්ධතිය | අවශ්‍යතාවයන් හඳුනාගෙන නිසි සැලසුම්ගත වැඩ පිළිවෙලක් ඔස්සේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් බැහැරවීම් වලදී සැලසුම් |

| | | | |
|---|---|---|---|
| | කටයුතු ඉදිරියට කල් දමා තිබුණු අතර, රු.මිලියන 4.84 ක ප්‍රතිපාදන යටතේ CCTV කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීමේ කාර්යය සිදුකර නොතිබුණි. එසේම උද්‍යාන මායිම වටා විදුලි වැටක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 12 ක ප්‍රතිපාදනයක් සිදුකර තිපුණද අදාළ කාර්යය සමාලෝචිත වර්ෂයේදී ඉටු කර නොතිබුණි. | සඳහා වූ සැලසුම් සකස් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය වෙත යොමුකර කටයුතු සිදුකරමින් පවතී. | සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | පින්නවල අලි අනාථාගාරයේ සංවර්ධන කටයුතු සඳහා වෙන්කර තිබුණු රු.මිලියන 29 ක ප්‍රතිපාදනයෙන් සියයට 62 ක් වූ රු.මිලියන 18 ක් අලි අනාථාගාරයේ භූමි සැකසුම් හා බර කිරීමේ තරාදියේ අළුත්වැඩියා කටයුතු සඳහා වෙන් කර තිබුණද එම කාර්යයන් දෙක ඉටු කර නොතිබුණු අතර රු.මිලියන 2.5 ක ප්‍රතිපාදන යටතේ ඉටු කිරීමට අපේක්ෂිත දියගම ෆාම් හවුස් අළුත්වැඩියාවෙහි භෞතික ප්‍රගතිය සියයට 5 ක් වැනි ඉතා අඩු මට්ටමක පැවතුණි. | අලි අනාථාගාරයේ භූමි අලංකරණය හා දියගම දෙමහල් ගොඩනැඟිල්ල නවීකරණය යන ව්‍යාපෘති 2023.09.20 දින ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණු බැවින්, සැලසුම් සකස් කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ සිදුකිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති විය. | අවශ්‍යතාවයන් හඳුනාගෙන නිසි සැලසුම්ගත වැඩ පිළිවෙලක් ඔස්සේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් බැහැරවීම් වලදී සැලසුම් සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය සඳහා දෙහිවල සත්වෝද්‍යානයට රු.7,982,747 ක් වටිනාකමැති ඖෂධ මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2, 4.2.3 හා 5.3.10 වගන්තිය ප්‍රකාරව විධිමත් පරිදි ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කර නොතිබුණු අතර දින 91 ක් විය යුතු ලංසු වලංගු කාල සීමාව දින 230 ක් දක්වා දීර්ඝ කර තිබුණි. | 2022/2023 වර්ෂවලදී ඖෂධ මිලදී ගැනීමේදී ලංසු ඇගයීම සඳහා දීර්ඝ කාලයක් ගතවී තිබුණි. ඉදිරියේදී එලෙස කාලය නොගෙන කඩිනමින් එම කටයුතු සිදුකර නිර්දේශ ලබාදෙන ලෙස තාක්ෂණික කමිටුව දැනුවත් කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |